# ආදර්ශවත් කතා 03

ටී.ඒ.එන්.හසංගා



# ආදර්ශවත් කතා 03

# ආදර්ශවත් කතා 3

කතෘ

**ටී.ඒ.එන් හසංගා**

වෙනත් කෘති

**පළමු දිගහැරීම**

**මහාමායා බාලිකා විදුහල**

**5 ශ්‍රේණිය D**

**2026/02/15**

ISBN 978 624 2111463

# පිදුම

ආදරණීය දෙමාපියන්ට හා ගුරුමෑණියන්ට මේ පොත සෙනෙහසින් පුද කරමි.

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යායේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත් කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සදහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන් වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර<br>
විදුහල්පතිනිය<br>
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර  මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය අතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය අතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සම්බුදු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
**2026.05.10**

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්විම වෙනුවෙන් මධ්‍ය පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභිශිංසන පණිවිඩයක් එක් කිරිමට ලැබිම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා  තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවිම ඉතා ප්‍රශංසනිය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණය ව්‍යාපෘති තුළින් සිසු දරුවන් පමණක් නොව,සමස්ත සමාජයටම වටිනා දැන්මක් සහ අනාගත සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි  උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත  සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රසංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්විමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බි. එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

**2026-05-10**

# පටුන


1. උත්සාහවන්තයා ජය ගනී

2. අකීකරු මුව පැටවා

3. අපූරු මිතුරෝ

# උත්සාහවන්තයා ජය ගනී

එකෝමත් එක කාලෙක දිනිති කියලා පුංචි ගැහැනු ළමයෙක් ජිවත් වුණා. දිනිති හැමදාම විභාගය අසමත් වෙනවා. ඒ නිසා ඇයට  පන්තියේ අය සමච්චල් කළා. කොන් කළා. මේ නිසා දිනිති හැමදාම ගෙදර ඇවිත් අඬනවා. දවසක් දා ඇය පාසල් යන විට තාත්තා මෙහෙම කීවා. “දුව මෙහෙම අඬලා වැඩක් නෑ. මේ දොස්තරලා, ගුරුවරු හැමෝම අඬලා ජය ගත්තේ නෑ. උත්සහ කරලා තමා හැමෝම ජය ගත්තේ. දුව කියන්නකෝ දුවගේ අනාගත බලාපොරොත්තුව මොකක්ද කියලා? මම කැමති වෛද්‍යවරියක් වෙන්න.

"එහෙනම් දුව හොඳට පාඩම් කරන්න". තාත්තා කීවා. එදා ඉදන් දිනිති හැමදාම පාඩම් කරා. දවසකට විෂයන් බෙදා ගෙන පාඩම් කරා. වෙහෙස මහන්සිය නොබලා උදේ හවා මහන්සි වුණා. ශිෂ්‍යත්ව විභාගය එන දවස උදා වුණා. දිනිති විභාගයට සහභාගි වුණා. විභාග ප්‍රතිඵල ලැබුණා. දිනිතිට හිතා ගන්න බැරිවුණා. ඇය තමයි පන්තියෙන්ම ලකුණු වැඩියෙන්ම ලබාගෙන තිබුණේ. ඇයට තාත්තා කියූ දෙය මතක් වුණා. ඇයට සතුට වැඩි වී නිවසට ගිය විට දෙමාපියන් වැලඳ ගත්තා. ඇය තම පියා ළඟට ගොස් ප්‍රතිඵල ගැන කිවුවා.

ඒක අහලා තාත්තට සතුටු කඳුළු ආවා ඒත් සමග දුවව වැළඳ ගත්තා. " දුව උත්සාහවන්තයා ජය ගනී" කියලා තාත්තා කිව්වා. අනාගතේ දවසක, දිනිති උසස්පෙළ විභාගය ද සමත් වී ඇයගේ අනාගත බලාපොරොත්තුව වූ වෛද්‍යවරියක් වීමට ඇයට හැකි වේවි.

නිමි.


No:
Date:

# අකීකරු මුව පැටවා

එකෝමත් එක කාලෙක අකීකරු මුව පැටියෙක් ජීවත් වුණා. තනිව නෙවෙයි මුව අම්මත් එක්ක දවසක් දා මේ මුව පැටියා අම්මට නොකියා සෙල්ලම් කරන්න ගියා. මේ මුව පැටියා මෙහෙම යද්දි දන්නෙම නැතුව අතරමං වුණා. මේ මුව පැටියා දුටු එක් සිංහයෙක් මුව පැටියා පසු පස එළවා ගෙන ආවා.

මුව පැටවා දුවලා දුවලා පණ බේරා ගත්තා. මේ අතර මුව අම්මා අඬ අඬා මුව පැටියව සොයනවා. මේක පුංචි ළමයෙක් දැක්කා.

"ඇයි මුව අම්මේ අඩන්නේ?" ළමයා ඇසුවා.

" මගෙ පුතා නැහැ ගේ හැම තැනම බැලුවා කොහේවත්ම හිටියෙ නෑ" මුව අම්මා පිළිතුරු දුන්නා.

"මම හොයලා දෙන්නම්"ළමයා කීවා.

ළමයා කැලයට ගොස් මුව පැටියව සොයාගෙන ආවා.

මුව පැටියා අඬ,අඬ සිටිනවා ළමයා දුටුවා. මුව පැටියෝ මාත් එක්ක එන්න.

" මම ඔයාගේ අම්මව හොයා ගත්තා" කියා ළමයා කීවා.

“ ඔය ඇත්තද?” මුව පැටවා ඇසුවා.

“ ඔව්” ළමයා කීවා.

ඊට පසු ළමයා මුව අම්මට මුව පැටවා භාර දුන්නා.“ අම්මා මම ආය අම්මා කියන දේ අහනවා” මුව පැටියා කීවා.

මුව අම්මා ළමයාට ස්තුති කළා.

“ මුව පැටියෝ අම්මා දෙන උපදෙස් පිළිපදින්න.මම ගිහින් එන්නම්” ළමයා පැවසුවා.

නිමි.


Date:

# අපූරු මිතුදම

එකෝමත් එක කාලෙක හාවෙකුයි, අලියෙකුයි ජීවත් වුණා. මේ දෙදෙනාගේ නම් අලියාගේ නම තමා රාමු. හාවගේ නම තමා හා හාමි මේ දෙන්නා හරි සුහද යාළුවෝ. දවසක් මේ දෙන්නා බෝල සෙල්ලම් කරනකොට රාමු ඇහුවා යාළුවේ ඔයා කැලේ ඉස්කෝලෙට යනවාද?

“ ඔව් යාළුවේ” හාවා පිළිතුරු දුන්නා.

“අනේ! මටත් ඉස්කෝලේ යන්න තිබ්බා නම්” රාමු දුකෙන් පැවසුවා.

“ හරි ඔයා දුක් වෙන්න එපා මම ටීචර්ට කියලා ඔයාට ඉස්කෝලෙට

එන්න කියන්නම්" හා හාමි පැවසුවාය.

" ස්තූතියි. යාළුවේ" රාමු කීවා

" හරි දැන් හවස් වෙලා. මම ගෙදර ගිහින් එන්නම්. හෙට ඉස්කෝලේ යන්න ඕන." හා හාමි පැවසුවා.

හොදයි යාළුවේ පරිස්සමින් ගිහින් එන්න. හා හාමි ගිහින් ඉස්කෝලෙ ටීචර්ට කීවා.

" හොඳයි දරුවෝ රාමුට ඉස්කෝලෙ එන්න කියන්න" ටීචර් කිවුවා.

" රාමු ඔයාට ටීචර් එන්න කීවා" හා හාමි කීවා.

“ස්තුතියි යාළුවේ මේ කළ උපකාරයට”


“ හරි දැන් පාසල් යන්න දැන්ම බෑගය ලෑස්ති කරන්න” හා හාමි කීවා.

“ හොඳයි යාළුවේ” රාමු කීවා.

රාමු උදෑසනින්ම පිබිදිලා දත, කට මැද මුහුණ සෝදා, පාසල් ගියා.

ශිල්ප හැදෑරුවා. ඊට පසු මේ යාළුවෝ දෙදෙනා සතුටින් ජීවත් වුණා.

නිමි.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත පතද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවක් වන කාන්තාව සවි බළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි මහනුවර මහාමායාබාලිකා විද්‍යාලයේ දියණියන් විදුහල්පතිනිය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු

සෙනවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)





නම - ටී.ඒ.එන්.හසංගා

පන්තිය - 5 ශ්‍රේණිය D

පාසල - මහාමායා බාලිකා විදුහල

පොතේ නම - ආදර්ශවත් කතා 3

පන්තිභාර ගුරුතුමියගේ අත්සන - -------------------------------

පුස්තකාල ගුරුතුමියගේ අත්සන - -------------------------------

ISBN 978 624 2111463